ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව

වයාපෘති වාර්තාව

# ජංගම දුරකථන භාවිතය සහ ළමා අධ්‍යාපන සංවර්ධනය

(පිළියන්දල අධ්‍යාපන කලාපයේ පාසල් වල උසස් පෙළ හදාරන සිසුන් ඇසුරිනි)

LE-3700

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධියේ අවශ්‍යතා
සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරනු
ලබන ව්‍යාපෘති වාර්තාව


මානව සම්පත් අභිවර්ධන ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 07.


2022- සැප්තැම්බර්


කොළඹ විශ්වවිද්‍යාලය IHRA 26 SEP 2022 මානව සම්පත් අභිවර්ධන ආයතනය

Library
2022
J2
Institute of Human Resource Advancement

## සාරාංශය

නූතන සමාජ පරිසරය තුළ අන්තර් පුද්ගල සන්නිවේදනය කුළුගන්වන කේන්ද්‍රීය තාක්ෂණික උපකරණයක් බවට ජංගම දුරකථනය පත්ව ඇතැයි කිවහොත් එය නිවැරැදිය. වර්තමානය වන විට එය හුදෙක් තාක්ෂණික මෙවලමක් පමණක් නොව ආර්ථික, දේශපාලනික, සාමාජීය හා සංස්කෘතිකමය වශයෙන් පුද්ගල ආකල්ප හා හැසිරීම් කෙරෙහි ද සෘජුව බලපෑම් කිරීමට සමත්ව තිබේ.

මෙම අධ්‍යයනය සඳහා ඉලක්කගත වන්නේ පාසල් යන වයස් කාණ්ඩයේ යෞවන යෞවනියන් ය. ජංගම දුරකථන භාවිතය ඔවුන්ගේ සමාජ සබඳතා හා අධ්‍යාපනික ක්‍රියාකාරකම් කෙරෙහි සිදු කර තිබෙන බලපෑම මෙහිදී විශ්ලේෂණය කෙරේ. ජංගම දුරකථන භාවිතය නිසා ළමා අධ්‍යාපන සංවර්ධනයට කුමන ආකාරයේ බලපෑමක් සිදු කෙරේ ද යන්න තෝරා ගත් පාසල් කිහිපයක් ඇසුරින් විමර්ශනය කිරීම මෙහි ප්‍රධාන පරමාර්ථය වන අතර පාසල් ළමුන්ගේ දුරකතථන භාවිතය කුමන මට්ටමක පවතින්නේ ද යන්න සොයා බැලීම, ඔවුන්ගේ වර්තමාන අධ්‍යාපන සංවර්ධන මට්ටම කෙබඳු දැයි හඳුනා ගැනීම, ජංගම දුරකථන භාවිතය හා ළමා අධ්‍යාපන සංවර්ධනය අතර සම්බන්ධය හඳුනා ගැනීම සහ ජංගම දුරකථන භාවිතය හා ළමා අධ්‍යාපන සංවර්ධනය සම්බන්ධකයන්, පර්යේෂණ ක්ෂේත්‍රය තුළ පවත්නා හිඩැස පිරීමට දායක වීම මෙහි සෙසු පරමාර්ථ අතර වේ.

මෙම පර්යේක්ෂණයේදී නිගාමී ප්‍රවේශය අනුගමනය කර ඇති අතර පර්යේෂණ උපායමාර්ගය සඳහා මෙහිදී සමීක්ෂණ උපායමාර්ගය යොදා ගෙන ඇත. ඒ අනුව ස්වයං පරිපාලිත ප්‍රශ්ණාවලියක් මඟින් ප්‍රාථමික දත්ත එක්රැස් කර ඇත. මෙම පර්යේෂණයේ සංගහනය වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ පිළියන්දල අධ්‍යාපන කලාපයේ 1AB කාණ්ඩයේ පාසල් දෙකක් වන මොරටුව වේල්ස් කුමර විද්‍යාලය හා වේල්ස් කුමරි විද්‍යාලය යන පාසල් ද්විත්වයේ උසස් පෙළ හදාරණ සිසුන් 126 ක් තෝරා ගෙන ඇති අතර පර්යේෂණයේ පහසුව, පවත්නා අයවැය සහ කාල සීමාවලට අනුකූල වීම සඳහා සසම්භාවී නොවන නියැදීමේ ක්‍රමයක් වන පහසු නියැදීමේ ක්‍රමය (Convenience Sampling) යටතේ දත්ත රැස්කර ගෙන ඇත. එම දත්ත විශ්ලේෂණය කිරීම සඳහා SPSS මෘදුකාංගයේ නවතම සංස්කරණය වන 26 වන සංස්කරණය යොදා ගෙන ඇත.

ජංගම දුරකථන භාවිතය විචල්‍යයේ සංඛ්‍යානමය සොයා ගැනීම් අනුව සිසුන්ගේ ජංගම දුරකථන භාවිතය මධ්‍යස්ථ මට්ටම ඉක්ම වූ ඉහළ මට්ටමකට ආසන්න තත්ත්වයක් පවතින බව පිළිබිඹු වේ.මේ සඳහා කොවිඩ්-19 වසංගත තත්ත්වය ද බලපා ඇති බව නිරීක්ෂණය වේ. ළමා අධ්‍යාපන සංවර්ධන විචල්‍යයේ සංඛ්‍යානමය සොයා ගැනීම් අනුව පාසල් සිසුන්ගේ ළමා අධ්‍යාපන සංවර්ධනය ද මධ්‍යස්ථ මට්ටම ඉක්මවූ ඉහළ මට්ටමකට ආසන්න තත්ත්වයක පවතින බව පිළිබිඹු වේ. ජංගම දුරකථන භාවිතය හා ළමා අධ්‍යාපන සංවර්ධනය අතර රේඛීය සම්බන්ධතාව සහ සමවිචලතාව පරීක්ෂා කිරීමේදී විචල්‍ය දෙක අතර ධන (+) රේඛීය සම්බන්ධතාවක් සහ විචල්‍ය දෙක අතර දත්ත විසිරීම (Scatteredness of Data) සමවිචලතා (Homoscedasticity) ආකාරයෙන් පවතින බවත් නිරූපණය වන බැවින් ජංගම දුරකථන භාවිතය සහ ළමා අධ්‍යාපන සංවර්ධනය අතර ධනාත්මක සම්බන්ධතාවක් පවතින බව තහවුරු වීම යනාදිය මෙම පර්යේක්ෂණයේ ප්‍රධාන සොයා ගැනීම් ලෙස දැක්විය හැකිය.

මෙම පර්යේෂණය තුළින් ගම්‍ය වනුයේ ජංගම දුරකථන භාවිතය ළමා අධ්‍යාපන සංවර්ධනයට ධනාත්මකව බලපා ඇති බවයි. ඒ අනුව පාසල් ළමුන්ගේ ජංගම දුරකථන භාවිතය ප්‍රශස්ත ලෙස ඉහල නැංවීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් නිර්මාණය කළ යුතු බව පර්යේක්ෂකයා නිගමනය කරයි. මෙම සොයා ගැනීම් වැදගත්කමකින් යුක්ත වන්නේ මෙය අධ්‍යාපන ඵලදායීතාවය හෝ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමටත් එය ජාත්‍යන්තර මට්ටම සමඟ සමපාත කිරීමටත් රුකුලක් වන නිසාවෙනි.

# පටුන

ස්තුතිය ..... III
සාරාංශය ..... IV
පටුන ..... V
ප්‍රස්තාර පටුන ..... VIII
වගු පටුන ..... VIII
රූප පටුන ..... VIII
ඇමුණුම් ලැයිස්තුව ..... IX
පළමුවන පරිච්ඡේදය ..... 1
1. හැඳින්වීම ..... 1
1.1. පර්යේෂණ පසුබිම ..... 1
1.2. ගැටලුව හඳුනා ගැනීම ..... 4
1.3. ගැටලුව පිළිබඳ ප්‍රකාශය ..... 7
1.4. අධ්‍යයනයේ පරමාර්ථ ..... 8
1.4.1. ප්‍රධාන පරමාර්ථය ..... 8
1.4.2. සෙසු පරමාර්ථ ..... 8
1.5. අධ්‍යයනයේ වැදගත්කම ..... 8
1.5.1. ජාතික ප්‍රතිපත්තිමය වැදගත්කම ..... 8
1.5.2. සමාජීය වැදගත්කම ..... 9
1.6. අධ්‍යයන ක්‍රමය ..... 9
1.7. අධ්‍යයනයේ සීමාවන් ..... 9
1.8. අධ්‍යයනය පරිච්ඡේදකරණය ..... 10
දෙවන පරිච්ඡේදය ..... 12
2. සාහිත්‍ය විමර්ශනය ..... 12
2.1. හැඳින්වීම ..... 12
2.2. ස්වායත්ත විචල්‍ය ..... 12
2.2.1. ජංගම දූරකථන භාවිතය ..... 12
2.3. පරායත්ත විචල්‍යය ..... 13
2.3.1. ළමා අධ්‍යාපන සංවර්ධනය ..... 13
2.4. විචල්‍යයන් අතර සම්බන්ධතාව ..... 14
2.5. සම්පිණ්ඩනය ..... 26
තෙවන පරිච්ඡේදය ..... 27
3. සංකල්පීකරණය සහ මෙහෙයුම්කරණය ..... 27
3.1. හැඳින්වීම ..... 27
3.2. විචල්‍ය සංකල්පීකරණය ..... 27
3.2.1. අධ්‍යයනයේ උපන්‍යාස ..... 27

3.2.2. විචල්‍ය අර්ථ දැක්වීම ........................................ 28
3.2.2.1. ජංගම දූරකථන භාවිතය ........................................ 28
3.2.2.2. ළමා අධ්‍යාපන සංවර්ධනය ........................................ 28
3.3. විචල්‍ය මෙහෙයුම්කරණය ........................................ 29
3.4. සම්පිණ්ඩනය ........................................ 31
සිව්වන පරිච්ඡේදය ........................................ 32
4. පර්යේෂණ ක්‍රමවේදය ........................................ 32
4.1. හැඳින්වීම ........................................ 32
4.2. පර්යේෂණ සැලැස්ම ........................................ 32
4.2.1. පර්යේෂණ ප්‍රවේශය ........................................ 32
4.2.2. පර්යේෂණ උපායමාර්ගය ........................................ 33
4.2.3. පර්යේෂණ තේරීම ........................................ 33
4.2.4. පර්යේෂණ ඒකකය ........................................ 33
4.2.5. සංගහනය සහ නියැදීම ........................................ 34
4.2.5.1. සංගහනය ........................................ 34
4.2.5.2. නියැදීමේ ක්‍රමය සහ නියැදිය ........................................ 34
4.3. විචල්‍යයන් සඳහා මිනුම් පරිමාණයන් ........................................ 35
4.3.1. ජංගම දූරකථන භාවිතය මැනීම ........................................ 35
4.3.2. ළමා අධ්‍යාපන සංවර්ධනය මැනීම ........................................ 35
4.4. විශ්වසනීයත්වය සහ වලංගුභාවය ........................................ 37
4.4.1. විශ්වසනීයත්වය ........................................ 37
4.4.2. වලංගුභාවය ........................................ 37
4.5. දත්ත රැස් කිරීම ........................................ 40
4.6. විශ්ලේෂණ ක්‍රමය ........................................ 40
4.7. සම්පිණ්ඩනය ........................................ 41
පස්වන පරිච්ඡේදය ........................................ 42
5. දත්ත විශ්ලේෂණය සහ ඉදිරිපත් කිරීම ........................................ 42
5.1. හැඳින්වීම ........................................ 42
5.2. දත්ත ප්‍රතිශෝධන ක්‍රියාවලිය ........................................ 42
5.3. ප්‍රජා විද්‍යාත්මක පැතිකඩ ........................................ 42
5.3.1. ශ්‍රේණිය ........................................ 42
5.3.2. ස්ත්‍රී පුරුෂ භාවය ........................................ 43
5.3.3. වයස ........................................ 44
5.3.4. මව/පියා/භාරකරුගේ රැකියාවේ ස්වභාවය ........................................ 44
5.3.5. සේවා මට්ටම ........................................ 45
5.3.6. භාවිතා කරන දූරකථන සබඳතාව ........................................ 46
5.4. විචල්‍යයන් පිළිබඳ විස්තරාත්මක සංඛ්‍යාති ........................................ 46

5.4.1. ජංගම දුරකථන භාවිතය විචල්‍යයේ විස්තරාත්මක සංඛ්‍යාති ........................ 46
5.4.2. ළමා අධ්‍යාපන සංවර්ධනය විචල්‍යයේ විස්තරාත්මක සංඛ්‍යාති ........................ 47
5.5. බහුවිචල උපකල්පන ........................ 48
5.5.1. ප්‍රමතිය ........................ 48
5.5.2. රේඛීයතාව සහ සමවිචලතාව ........................ 50
5.6. උපන්‍යාස පරීක්ෂා කිරීම ........................ 51
5.7. ප්‍රතිපායන විශ්ලේෂණය (Regression Analysis) ........................ 51
5.8. සම්පිණ්ඩනය ........................ 52
සයවන පරිච්ඡේදය ........................ 53
6. සමාලෝචනය, නිර්දේශ සහ නිගමන ........................ 53
6.1. හැඳින්වීම ........................ 53
6.2. සමාලෝචනය ........................ 53
6.3. නිර්දේශ ........................ 56
6.4. නිගමන ........................ 57
ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය ........................ 58
ඇමුණුම ........................ 64